
රසික සූරියආරච්චි

# පාලිත ගනේවත්ත ගේ "මාවත අබියස"

ලාංකික මධ්‍යම පන්තියේ කතාන්දරයෙන් බිඳක් මහා සිංහල ලේඛක මාර්ටින් වික්‍රමසිංහ විසින් රචිත "ගම් පෙරලිය", "කලියුගය" සහ " යුගාන්තය" තුන් ඈඳුතු නවකතා යනු දහනමවන ශතවර්ශයේ අගභාගයේ සිට විසිවන ශතවර්ශයේ මැද භාගය දක්වා සිදුවූ ලංකාවේ ග්‍රාමීය ඉහල පැලැන්තියේ නාගරික සංක්‍රමණයත්, නාගරික ධනපති පන්තියේ වර්ධනයත් ලේඛනගත කළ අසමසම නිර්මාණ බව අවිවාදාත්මකය.




ලාංකික ප්‍රජාවේ වැදගත් අනුඛණ්ඩයක් ලෙස විසිවන සියවසේ මැද භාගයේ විකාශනය වූ නාගරික මධ්‍යම පන්තියේ වංශකතාව ලේඛනගත කිරීමද පෙර කී තුන් ඈඳුතු නවකතාවෙන් මාර්ටින් වික්‍රමසිංහ සිදුකළාක් හා සමාන වූ වැදගත් කටයුත්තක් බව ගුණදාස අමරසේකර පවසා ඇත. මේ සඳහා ගුණදාස අමරසේකර ගේ සම්මාදම වූයේ " ගමනක මුල" නම් වූ නවකතාවෙන් ඇරඹී, කොටස් නමයකින් යුතුව ගලා ගොස් " ගමනක අග" නමින් අවසාන වුණු නවකතා මාලාවයි. සමස්තයක් ලෙස ගත් කළ, එය පැසසිය යුතු උත්සාහයක් වෙතත්, "ගමනක" නවකතා මාලාවේ අවසානය ලඟාවූයේ අමරසේකර ගේ පුහු දේශපාලන මතවාද පාඨකයාට බලහත්කාරයෙන් පොවන්නට තැත් කරන හුදු වාර්තාමය ප්‍රචාරකවාදී ප්‍රලාපයක් ලෙසින් වීම කණගාටුවට කරුණකි. අප හොඳින් දන්නා කාල වකවානුව පදනම් කරගත් මේ නවකතා මාලාවේ අවසාන කොටස් කිහිපයට ඔබ්බවා ඇති දේශපාලන කුණු කන්දල්වල ඒකපාක්ෂිකත්වය ගැන සලකා බලන කළ, මේ නවකතා සරණියේ මුල් කොටස් පිළිබඳවද සාධාරණ සැකයක් ඇතිවීම වැලකිය නොහැකි ය.

පාලිත ගනේවත්ත ලියූ "මාවත අබියස" නවකතාව පිළිබඳ කතිකාවතක යෙදීම වැදගත් වන්නේ මේ පසුබිම තුලයි.

සිඩ්නි වාසී කවියෙක්, කෙටිකතාකරුවෙක්, පරිවර්තකයෙක් සහ ගුවන් විදුලි නිශ්පාදකවරයෙක් ලෙස අප හොඳින් දැන සිටි ආචාර්ය පාලිත ගනේවත්ත සිය පළමුවෙනි නවකතාව වූ "ඇවිත් නොරටක" ලියා පලකළේ වසර 2006 දී ය. එහිදී පාලිත ගනේවත්ත සාකච්ඡාවට ලක් කළේ ලංකාවේ සිට මෙ රටට පැමිණාණි පවුලකට සිය සංක්‍රමණික ජීවිතයේ මුහුණ දිමට සිදුවූ ගැටළු සමුදායයි. ඔහු විසින් රචනා වී ඇති කෙටිකතාවලින් බහුතරයද මේ පසුබිම ඇතුව කෙරුණු නිර්මාණ විය.

සිය දෙවන නවකතාව වන "මාවත අබියස" තුලින් පාලිත ගනේවත්ත අපේ අවධානය යොමු කරවන්නේ පෙර මධ්‍යම පන්තියේ එක් අනුකණ්ඩයක් වූ ප්‍රාදේශීය නගරාසන්නව වෙසෙනමුත් ගම හා තවදුරටත් සම්බන්ධතාවය පවත්වාගෙන යන, රජයේ සේවයේ වැටුපෙන් යැපෙන, ලාංකික පහල මධ්‍යම පන්තියේ බොහෝ දුරට දුක්බර වූ වංශකතාව වෙතටයි. මේ ජන කොටසේ ජීවිතය නාගරික ලුම්පන් පන්තියේ ජීවිතය තරම් ගොරහැඩි නොවේ. ඒ සමගම, ගම්බදව වෙසෙන අඳ ගොවි පන්තියේ ජීවිතය තරම් ශෝකාකූල ද නොවේ. මොවුනට තරමක හෝ නිශ්චල දේපල හිමිය. ස්ථිර ආදායම් මාර්ග ඇත. බලාපොරොත්තු විය හැකි පරිද්දෙන්ම මේ පහල මධ්‍යම පන්තියේ ජීවිතවල ප්‍රධාන ප්‍රශ්ණ වන්නේ දරුවන් ගේ ඉගෙනීම, ඔවුන් ගේ අනාගතය වැනි සුළු ධනේෂ්වර කරුණු වේ.

"මාවත අබියස" නවකතාව ගෙතී ඇත්තේ රජයේ ලිපිකරු සේවයේ නියුතු ධර්මසේන, ඔහු ගේ බිරිය ඇග්නස් සහ ඔවුන්ගේ දරුවන් සිව්දෙනාගෙන් වැඩිමහලු දෙදෙනාව වන සනත් සහ මංගලා වටාය. දරුවන් ගේ ඉගෙනීමේ පහසුව සඳහා ප්‍රාදේශීය නගරයක් අසල කුලී නිවසක වෙසෙන දෙමව්පියන් ගේ ප්‍රශ්ණ, ගමේ උරුමයෙන් ඈත් වී හැදී වැඩෙන දරුවන් ලබන අධ්‍යාපනයේ මට්ටම අනුව ඔවුන්ගේ අනාගතය තීරණයවන අයුරු සහ තරුණ සමයේ ගැහැණු පිරිමි දෙපිරිසටම එක ලෙස මුහුණ දෙන්නට සිදුවන ආදරය පිළිබඳ ගැටළු පාලිත ගනේවත්ත ගේ සාකච්ඡාවට මෙහි දී බඳුන් වේ. තම ජීවිත ගලා යන ආකාරයේ වෙනසක් තමන්ම කිරීම අසීරු වෙතත්, අවසාන විග්‍රහයේ දී වැදගත්වනුයේ පවුල් ඒකකයේ සමගිය සහ එකමුතුව බව කියාපාමින් නවකතාව කෙළවර වෙයි.

"මාවත අබියස" රචනයේ ලා පාලිත ගනේවත්ත භාවිතාකර ඇති භාෂා ශෛලිය රමණීය වේ. එය නවකතාවේ ගලා යාම පහසු කරවයි. දෙබස් සහ විස්තර වර්ණනා සුමටය, සුගමය. හැටේ හැත්තෑවේ දශකවල ලංකාවේ හැදී වැඩුණු අයෙකුට මේ කතාව හා සමීප සබඳතාවක් ඇතිකර ගැනීම ඉතා පහසුය. ඒ සියළු දෙයින් ස්ඵුට වන්නේ පාලිත ගනේවත්ත ගේ සිංහල භාෂාව හැසිරවීමේ පරිනත බවයි.

"මාවත අබියස" නවකතාව ලියවී ඇත්තේ මෙහි චරිත දෙස තුන්වෙනි ඇසකින් බලමිනි. නවකතාවේ විවිධ කොටස්වලදී ඒ චරිත හතරෙන් වරින් වර ඉස්මතු වී ප්‍රධාන භූමිකාව රඟයි. පාලිත ගනේවත්ත නවකතාවේ අන්තර්ගතය ඉදිරිපත් කිරීමට උපයෝගී කොටගෙන ඇති මේ ව්‍යුහය මට සිහිපත් කලේ ජී.බී. සේනානායක ගේ නවකතා රචනා ශෛලියයි.
නවකතාවක් රචනා කරන්නෙකු තම කතා වස්තුව පාඨකයාට ඉදිරිපත් කිරීම සඳහා එකතු කර ගන්නා චරිත, සිදුවීම් සහ කරුණු බොහෝ විට තමන් විසින්ම අත්දැක ප්‍රත්‍යක්ෂ කරගත් ඒවා හෝ තමන් දුරස්ථව අත්විඳි ඒවා බව නොරහසකි. ඒ අතරම, මුළුමනින්ම ප්‍රභන්ධ ලෙස සැලකිය හැකි චරිත, සිදුවීම් සහ කරුණු ද නවකතාවෙහි ලා උපයෝගී කර ගැනීමට සිදුවේ. යථාර්තවාදී නවකතාවක් රචනා කිරීමේ දී වැදගත්වන්නේ එලෙස තමන් ගේ කෝෂ්ඨාගාරයෙන් රැගෙන එකට ඈඳන චරිත, සිදුවීම් සහ කාරණා නවකතාවේ මුඛ්‍ය පරමාර්ථය සාක්ෂාත් කරගැනීමට කෙතරම් දුරට ඉවහල්වන්නේ ද, නවකතාවේ අන්තර්ගතය ඉදිරිපත් කිරීමේදී අත්‍යවශ්‍යම අවස්ථාවලදී භාවිතා කළයුතු ප්‍රබන්ධිත චරිත, සිදුවීම් සහ කාරණා සමස්ත නවකතාවේ යථාර්තවාදීභාවයට කෙතරම් බලපෑමක් කරන්නේද යන්නයි.

පාලිත ගනේවත්ත, තම "මාවත අබියස" නවකතාවේ ප්‍රධාන චරිතයක් වන සනත් ට විශ්ව විද්‍යාලය ඇතුලත් වීමත් සමගම රැකියාවක් ලබා දී, ඒමගින්, මාසික වැටුපෙන් කුලී නිවසක දිවිගෙවන සනත් ගේ දෙමව්පියන් පොදුවේ විශ්ව විද්‍යාලයට දරුවන් ඇතුලත් වීමෙන් පසු පවුලකට විඳින්නට සිදුවන ආර්ථික ගැටළුවලින් මුද ගනියි. ඉංජිනේරු පීඨයක සිසුවෙකුට මෙලෙස සෑම සතියකට නිශ්චිත දින තුනක දිවා කාලයෙන් අඩක් බැගින් රැකියාවක් සඳහා ගත කළ හැකි තත්වයක් හැත්තෑවේ දශකයේ කටුබැද්ද මණ්ඩපයේ තිබුණේද, ඒ ආකාරයේ තාවකාලික රැකියා මහජන බැංකුවේ තිබුනේද වැනි යථාර්තය පිළිබඳ ප්‍රශ්ණ පසෙකට දැමූවද, සනත් සහ ඔහුගේ දෙමව්පියන්ව මේ සමාජ ස්ථරයේ කාටත් පොදු ආර්ථික ප්‍රශ්ණවලින් ඈත් කිරීම තුලින් පෙර සඳහන් වූ ගුණදාස අමරසේකර මතු කළ මධ්‍යම පන්තියේ වංශකතාව ලේඛණගත කිරීමේ කර්තව්‍යයට සැලකිය යුතු තරමේ හානියක් සිදුවී ඇති බව පෙනේ.

ධර්මසේන සහ ඇග්නස් තමන් ගේ එක් සිහිනයක් සැබෑ කරගෙන ජීවිතයේ සැඳෑ කාලය තමන් ගේ ම නිවසක ගත කිරීම සඳහා ගම බලා යෑමත්, දෙමව්පිය උපදෙසට විරුද්ධව කටයුතු කර පසුව අනාථ වූ සිය දියණිය සහ ඇගේ දරුවාට හව්හරණය ලබා දීමට ඔවුන් ඉදිරිපත් වීමත් "මාවත අබියස" නවකතාවේ අවසානයේ එන සංවේදී සිදුවීම් වේ. මෙමගින් පාලිත ගනේවත්ත පාඨකයාගේ සිත තුල මානුශිකත්වය පිළිබඳ හැඟීම් ඉස්මතු කරවයි. ධර්මසේන හරහා එදා ගම්බදව පැවති සමාජ තත්වය පිළිබඳව කරුණු කෙටියෙන් හෝ ඉදිරිපත් කිරීමද "මාවත අබියස" නවකතාවේ වැදගත් කොටසක් ලෙස මම දකිමි.

පනහේ හැටේ දශකවල පවුල් ජීවිතය තාත්විකව නිරුපනය කිරීම සඳහා ධර්මසේන සහ ඇග්නස් යුවලට දරුවන් සිව් දෙනෙකු ලබාදුන්නද, එයින් කණිටු දරුවන් දෙදෙනා ගේ චරිත ඉස්මතු නොකරන්නට පාලිත ගනේවත්ත තීරණය කොට ඇත. ඒ, මේ නවකතාවේ පසුව එන කොටසක දී උපයෝගී කර ගැනීමට දැයි සාධාරණ සැකයක් පාඨකයාට ඇතිවේ.

"මාවත අබියස" නවකතාවේ එන මා සිත ගත් එක් සුළු සිදුවීමක් නම්, ගාල්ලේ නගරබද මාර්ගයක් අසල බස් රථයක් එනතුරු බලා සිටින ධර්මසේන, ඒ මාර්ගයේ ඇවිදිමින් සිටින ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජයානන්ද දහනායක හමුවීම සහ ඔහු සමග ඉතා කෙටි හෝ සංවාදයක යෙදීමයි. ඒ සිදුවීම, පෙර ගමන් පසු ගමන් රිය ඇතිව, ආයුධ සන්නද්ධ පොලිස්කරුවන් සහ පෞද්ගලික ආරක්ෂකයින් පිරිවරාගෙන වීදුරු අඳුරු රථවල නැගී මහමග ගමන්ගන්නා අනෙකුත් අයගේ ආරක්ෂාව ද නොතකා විදුලි වේගයෙන් යනෙන දේශපාලකයින් සිටින අද දවසේ වෙසෙන පාඨකයින්ට එදා හැත්තෑවේ දශකයේ පැවති සාමකාමී වාතාවරණය පිළිබඳ සොඳුරු ස්මරණයන් යලි සිහිපත් කරවනු නොඅනුමානය.

ඒ සිදුවීම හැරුණු කොට, මේ නවකතාව දිග හැරෙන හැත්තෑව දශකයේ මුල් භාගයේ ලංකාවේ සිදුවුනු කිසිදු සමාජමය සංසිද්ධියක් පාලිත ගනේවත්ත තම කෘතියට අන්තර්ග්‍රහණය කරගෙන නොමැති වීම කැපී පෙනෙයි. රටේ සිදුවූ 1971 කැරැල්ල, හදිසි නීතිය, ආහාර හිඟය වැනි පොදු සිද්ධීන් කෙසේ වුවද සනත් ගේ විශ්ව විද්‍යාල ජීවිතය හා සම්බන්ධ එවැනි සිදුවීම් සරලව හෝ ඇතුලත් කිරීමට නම් ඒ පිළිබඳව මනා අධ්‍යයනයක් කිරීමට අවශ්‍ය වෙනු ඇත.

දශක දෙකකට අධික කාලයක් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර වාසය කරන වෘත්තියෙන් ජීව විද්‍යාඥයෙකුවන ආචාර්ය පාලිත ගනේවත්ත ගේ "මාවත අබියස" නවකතාව 2009 දයාවංශ ජයකොඩි නවකතා අත්පිටපත් තරගයෙන් හොඳම නවකතාව ලෙස පිදුම් ලද කෘතියයි. එය නොරටකට වින් වාසය කරන අප හැමට ආඩම්බර විය හැකි කරුණකි. ■

පරිවර්තන ( TRANSLATIONS)

ඔබේ සියළුම පරිවර්තන කටයුතු සඳහා,

අධ්‍යාපන, වෘත්තීය, උප්පැන්න, මරණ, විවාහ
සහතික හා වෙනත් ලියකියවිලි

අමතන්න.

( NAATI , LEVEL 3 ) පරිවර්තක

ආචාර්ය ප්‍රේමා කුඩලිගම.

දුරකතන : (03)94671658 , 0458 60 60 66

ලිපිනය: 6/117 ප්ලෙන්ටි පාර , බන්ඩූරා, වික්ටෝරියාව, 3083
ඕස්ට්‍රේලියාව

ඊමේල් : premaku& bigpond.com